## කැපුම් සහිත බටය ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම

- හොඳින් මට්ටම් කරන ලද ලියද්දෙහි පස් මට්ටමේ සිට සෙ.මී. 5 පමණ ඉහලට සිටින සේ මෙම කැපුම් සහිත බටය සෙ.මී. 15 ක් පස තුළට ගිල්වන්න.



- ඇතුළත මඩ ඉවත් කරන්න. ටික වේලාවකින් පස තුළ ඇති ජල මට්ටම බටය තුළින් දැකගත හැකිවේ.



- නියර ආසන්නයේ පහසුවෙන් බලා ජලය මැන ගත හැකි ස්ථානයක බටය සිටුවන්න. වගා කාලය තුළ පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වන සේ බටය සිටවූ ස්ථානය පැහැදිලිව සළකුණු කර ගන්න



## වඩා ඵලදායි ප්‍රතිඵල ලබාගැනීමට

- යාය පදනම් කර ගනිමින් කුඩා වැව්, ඇළ මාර්ග යටතේ යොදාගත යුතුය.
- ක්ෂේත්‍රයේ නිලධාරීන් හා ගොවිමහතුන් එක්ව මනා දැනුවත්භාවයෙන් කටයුතු කල යුතුය.
- යායේ ඉහළ, මැද හා පහළ කොටස් නියෝජනය වන පරිදි බට ස්ථානගත කළ යුතුය.
- යායේ ඉහළ බටවල ජල මට්ටම අනුව ජලය සම්පාදනය තීරණය කර ගත යුතුය.
- ගොවිමහතුන් එකමුතුව කණ්ඩායමක් ලෙස කටයුතු කළ යුතුය.
- වර්ෂාවත් සමග යායේ ගොවි මහතුන් එක්ව වගාව ආරම්භ කිරීම කළ යුතුය.
- පළමු සී සෑමේ සිට වගාව ස්ථාපනය දක්වා නිසි අයුරින් බිම් සැකසීම හා එකම වයස් කාණ්ඩයේ වී ප්‍රභේද භාවිතා කිරීම සිදු කළ යුතුය.

## සැළකිලිමත් විය යුතු විශේෂ කරුණු

- වගාවේ මුල් සති 2-3 තුළ මනාලෙස වල් මර්ධනය කිරීම
- පස තෙත්ව ඇති විට පොහොර යෙදීම

ලවණතාවයට පාත්‍ර කුඹුරක හම් ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය යෝග්‍ය නොවන අතර, යකඩ විෂවීම් පවතින කුඹුරු වලට යෝග්‍ය වේ.


තාක්ෂණික දායකත්වය

ඩබ්. එම්. යූ. කේ. රත්නායක (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - ජල කළමනාකරණය)

එන්. එම්. මුතුකුමාර (පර්යේෂණ සහකාර)

ඊ. එම්. පියුමිකා (තාක්ෂණ සහකාර)

විමසීම්

අධ්‍යක්ෂ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, ඉබ්බාගමුව

දුරකථන- 0372258561 ෆැක්ස්- 0372259588

සැකසුම

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

මුද්‍රණය

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව




# වී වගාවේ ජලය කාර්යක්ෂමව භාවිතයට ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය

2018

## හැඳින්වීම

සාර්ථක වී වගාවක් සඳහා බලපාන තීරණාත්මක සාධක අතර ජලය ප්‍රධාන තැනක් ගනී. සීමිත ස්වභාවික සම්පතක් වන ජලය කාර්යක්ෂමව භාවිතා කළ යුතුවේ. අර්ධ ජලජ ශාකයක් වන වී, වගාවේදී දිගටම ජලය බැඳ තබාගැනීම අත්‍යාවශ්‍ය නොවන අතර, කඩින් කඩ ජලය යෙදීම ප්‍රමාණවත්ය. මේ සඳහා ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය හඳුන්වා දී ඇත.

ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය යනු වී වගාවේ දී පාංශු තත්ත්වය හා බෝගයේ වර්ධක අවධිය සලකා බලා සාර්ථක ලෙස ජලය කළමනාකරණය කර ගත හැකි ක්‍රමයකි. මෙහිදී ජලය යොදන අවස්ථාව ජලය නිකුත් කරන නිලධාරීන්ට හා ගොවි මහතුන්ටම තීරණය කළ හැක.

## වාසි

- ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකිවීම.
- ජලය කාර්යක්ෂමව නිසි ලෙස භාවිතා කළ හැකි අතර, අධි ජල භාවිතය හා ජල හිඟතාවය වළක්වා ගත හැකිවීම.
- දැනට භාවිත වන ජල ප්‍රමාණයෙන් ජලය 10-20% අතර ප්‍රමාණයක් (ජල මුර 2-3 ක් පමණ) ඉතිරි කරගත හැකි වීම

  එම ඉතිරි වන ජලය,
  - බෙත්ම ක්‍රමයකින් තොරව වගා වපසරිය වැඩි කිරීමට
  - දිගුකාලීන වී ප්‍රභේද වගාවට
  - කන්න දෙකක් අතර, (මුං වැනි) වෙනත් වගාවන් සඳහා භාවිතා කිරීමට
  - ඊළඟ කන්නය නියම වේලාවට ආරම්භ කිරීමට උපයෝගී කර ගත හැක.
- වර්ෂා ජලය කාර්යක්ෂමව භාවිතයට ගත හැකිවීම.

## ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය ක්ෂේත්‍රයේ භාවිතා කරන අයුරු

- පැළ සිටුවීමෙන් පසු හෝ වපුරා සති 02 ක් පමණ ගත වූ පසු ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය භාවිතා කරන්න. සෙ.මී. 5 ක් උසට ජල සම්පාදනය කර ජල සම්පාදනය නතර කරන්න.
- ජල සම්පාදනය නතර කිරීමෙන් පසු හා පස මතුපිට සිට සෙ.මී. 15 ගැඹුරට ජලය බැස ගිය පසු නැවත පෙර පරිදි ජල සම්පාදනය කරන්න. කැපුම් සහිත බටයක් ආධාරයෙන් ජල මට්ටම නිර්ණය කරන්න.



කැපුම් සහිත බටය තුළින් ජල මට්ටම මැන ගැනීම

- මල් පිපෙන අවධියේදී වී බෝගය ජල හිඟතාවයට වඩාත්ම සංවේදී වන බැවින් මල් පිපීම ආරම්භයේ සිට සති 2 ක් දක්වා කාලය තුළ සෑමවිටම ක්ෂේත්‍රයේ පස මතුපිටට ඉහළින් ජල මට්ටම (උපරිම සෙ.මී.5) ක් පවත්වා ගන්න.



මල් පිපෙන අවධියේදී ක්ෂේත්‍රයේ ජලය පස් මට්ටමට ඉහළින් පවත්වා ගැනීම

- සති 2 ට පසු නැවත පෙර පරිදිම ජල සම්පාදනය කරන්න.
- අස්වනු නෙළීමට අපේක්ෂිත දිනයට සති දෙකකට පමණ පෙර ජල මට්ටම ක්‍රමයෙන් අඩු කරන්න.

## ජලය ප්‍රමාණය තීරණය කරන කැපුම් සහිත බටය සැකසීම

- අඟල් 8 ක් පමණ දිග අඟල් 4 ක් පමණ විශ්කම්භය සහිත පී.වී.සී. බටයක් ගන්න.
- මෙය වටේට කියත් පටියකින් හරස් අතට කැපුම් කිහිපයක් යොදන්න.







අඟල් 4 විශ්කම්භයක් හා අඟල් 8 ක් පමණ දිගින් යුත් පී.වී.සී. බටයක හරස් කැපුම් යෙදීම